
6. පුරස්ථ ග්‍රන්ථියේ පිළිකා

රෝග ලක්ෂණ

- අවශ්‍යතාව ඇතත් මුත්‍රා පහකිරීමේ අපහසුතාව
- මුත්‍රා කිරීම ඇරඹීමේ හා මුත්‍රාධාරාව පවත්වා ගැනීමේ අපහසුතා
- මුත්‍රා කිරීමෙන් පසු ද සම්පූර්ණයෙන්ම මුත්‍රා පිට නොවුනා සේ දැනීම
- නිතර නිතර මුත්‍රා යෑම
- රාත්‍රියට මුත්‍රා කිරීමේ වාර ගණන වැඩිවීම
- මුත්‍රා සමග ලේ පිටවීම



7. තයිරොයිඩ් ග්‍රන්ථියේ පිළිකා

රෝග ලක්ෂණ

- තයිරොයිඩ් ග්‍රන්ථියේ විශාලවීමක් හෝ වෙනසක්
- ගෙලෙහි වසාගැටිති ඉදිමීමක්
- හේතුවක් රහිත කටහඬේ ගොරෝසු බවක්
- ගෙලෙහි වේදනාවක්
- ගිලීමේ අපහසුවක්
- හුස්ම ගැනීමේ අපහසුවක්



පහත රෝග ලක්ෂණ සති තුනකට වඩා පවතීද?

- මුඛයේ සුදු හෝ රතු ලප මතුවීමක්
- ගෙල /තයිරොයිඩ් ග්‍රන්ථියේ ඉදිමුමක්
- කල් අල්ලා පවතින ගිලීමේ අපහසුවක් හෝ අපිරිණ තත්ත්වයක්
- මළපහ කිරීමේ/මුත්‍රා කිරීමේ පුරුදුවල වෙනසක් හෝ ඒ සමග ලේ පිටවීමක්
- කටහඬෙහි වෙනසක්
- කල් අල්ලා පවතින කැස්ස හෝ කැස්ස සමග ලේ පිටවීම
- පියයුරුවල හෝ අන් තැනක ගැටයක් හෝ ඝනවීමක්
- කාන්තාවක් නම් යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය ස්‍රාවයක් හෝ රුධිරය පිටවීමක්
- ගැටයක, ලපයක හෝ ඉන්නෙකුගේ හදිසි වෙනස් වීමක් හෝ ශීඝ්‍ර වර්ධනයක්
- සුව නොවන තුවාලයක්

එසේ නම් ඒවා පිළිකාවක ලක්ෂණ වීමට ද ඉඩ ඇත.

හැකි ඉක්මනින් වෛද්‍ය උපදෙස් ලබාගන්න.

ජාතික පිළිකා මර්දන වැඩසටහන

555, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථනය: 011-2368627, 011-3159227
E-mail: nccpsl@yahoo.com Web: www.nccp.health.gov.lk

මුද්‍රණය: බස්නාහිර පළාත් මුද්‍රණාලය 011-2390111

පිළිකාව කලින් හඳුනාගැනීමෙන් ජීවිතය ජයගනිමු !



පිළිකාවලින් 1/3 ක්ම කලින් හඳුනාගැනීමෙන් සම්පූර්ණයෙන් සුවකළ හැකිය

ඔබේ ශරීරයේ දිගටම පවතින යම් වෙනසක් ඇතිනම් වහාම වෛද්‍යවරයෙකු හමුවන්න

පිළිකා කලින් හඳුනාගැනීම සඳහා

පහත සඳහන් රෝග ලක්ෂණ පිළිබඳව සැලකිලිමත් වන්න.

1. මුඛ පිළිකාව / පූර්ව මුඛ පිළිකාව

මුඛ පිළිකාව ඇතිවීමට පෙර පූර්ව පිළිකා අවස්ථාවේදීම එය හඳුනාගත හැකිය.

රෝග ලක්ෂණ



කල් පවතින සුදු ලප



කල් පවතින රතු ලප



කල් පවතින සුදු සහ රතු මිශ්‍ර ලප



මුඛයේ අසාමාන්‍ය දැවිල්ලක් සමග තොල් සහ ශ්ලේෂ්මලයේ ෂන වීමක් සහ සුදුමැළි වීමක්



කාලයක් පවතින සුව නොවන තුවාලයක්

මෙම ලක්ෂණ ඇත්නම් වහාම දන්ත ශල්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

2. ගලනාල පිළිකා

රෝග ලක්ෂණ

සති තුනකට වඩා පවතින

- ක්‍රම ක්‍රමයෙන් ඇතිවන ගිලීමේ අපහසුතා
- ගිලීමේ දී වේදනාවක්
- ශරීරයේ බර අඩුවීමක්






3. මහාන්ත්‍ර හා ගුද මාර්ග පිළිකා

රෝග ලක්ෂණ

- මළපහ සමග ලේ පිටවීමක්
- මළපහ කිරීමේ පුරුදුවල වෙනසක්
- නිතර නිතර ඇතිවන මළබද්ධය හෝ පාචන ස්වභාවයක් හෝ ගුද මාර්ගයෙන් ලේ පිටවීමක්
- මළපහ පෙරට වඩා සිහින් ස්වභාවයක් ගැනීම
- මළපහ කිරීමෙන් පසුව ද මළපහ පිටවීමේ අසම්පූර්ණ බවක් දැනීම
- උදර වේදනාව
- අනපේක්ෂිත ලෙස ශරීරයේ බර අඩුවීමක්



4. පියයුරු පිළිකා

රෝග ලක්ෂණ

මෑතකදී ඇති වූ පියයුරුවල හැඩයේ වෙනස්වීමක් හෝ පැහැදිලි අසම්මිතික බවක්





පියයුරුවල ගැටිත්තක් හෝ ඉදිමීමක්



පියයුරෙහි වලගැසීමක්



දොඩම් ලෙල්ලක මතුපිට වැනි සමේ වෙනස්වීමක්, සම මතුපිට දදයක්/ තුවාලයක්

තනපුඩුවේ ගිලීයාමක්/අසාමාන්‍ය ශ්‍රාවයක්




ස්වයං පියයුරු පරීක්ෂාවෙන් පියයුරු පිළිකා කලින් හඳුනාගත හැක.

5. ගැබ්ගෙල පිළිකා

රෝග ලක්ෂණ

- යෝනි මාර්ගයෙන් අක්‍රමවත් රුධිර වහනයක්
- ලිංගික සංසර්ගයට පසු රුධිර වහනයක්
- යෝනි මාර්ගයෙන් දුර්ගන්ධයකින් යුතු ස්‍රාවයක් පිටවීම.
- මාස් ශුද්ධිය නැවතී ඇති කාන්තාවන්ගේ යෝනි මාර්ගයෙන් රුධිරය පිටවීම.



පැප් පරීක්ෂාවක් මගින් ගැබ්ගෙල වෙනස්කම් පිළිකාව ඇතිවීමට පෙර හඳුනාගත හැක.